# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

## ක්‍රීඩා උපදේශක/නේවාසිකාගාර පාලිකා තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම.

ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වන ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 1. ක්‍රීඩා උපදේශක | 05 |
| 2. නේවාසිකාගාර පාලිකා | 01 |

### 01. ක්‍රීඩා උපදේශක

(පාපන්දු, වොලිබෝල්, ක්‍රිකට්, ටේබල් ටෙනිස්, බැඩ්මින්ටන්, ජූඩෝ, නෙට්බෝල්, පිහිනුම්, මලල ක්‍රීඩා, කබඩි, ශක්තිය හා යෝග්‍යතාව හඳුරා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබාදේ.)

1.1 තනතුරේ ස්වභාවය - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

සටහන - විශ්‍රාම වැටුප් සහිත බව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වෙනස් වේ.

1.2 බඳවා ගන්නා ශ්‍රේණිය - 111 ශ්‍රේණිය

1.3 වැටුප් පරිමාණය

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛනයට අනුව MN4-2016 රු. 31,490-10X445-11X660-10X730-5X750-54250/- ක වැටුප් පරිමාණයක් හිමිවේ.

1.4 වයස් සීමාව

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

1.5 බඳවා ගැනීමේ සුදුසුකම්

1.5.1 අධ්‍යාපනික සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්‍රීඩාව හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ කළමනාකරණය, සංඛ්‍යාන විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, පෝෂණය, කායික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව යාන්ත්‍රණ විද්‍යාව, භෞතික විද්‍යාව, ක්‍රීඩා ආර්ථික විද්‍යාව, ක්‍රීඩා විශ්‍රාන්ති කළමනාකරණය, ක්‍රීඩා ශික්ෂණ ශාස්ත්‍රය යන විෂයන්ගෙන් එක් විෂයක් සහිතව උපාධියක් ලබා තිබීම.

1.5.2. වෘත්තීය සුදුසුකම්- අදාළ නොවේ.

1.5.3. පළපුරුද්ද - අදාළ නොවේ.

1.5.4. කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.5.5 වෙනත් - 1. ශ්‍රී ලාංකික පුරවැසියකු වීම

2. විශිෂ්ට චරිතයක් ඇත්තකු වීම

### 2. නේවාසිකාගාර පාලිකා

2.1 තනතුරේ ස්වභාවය - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

සටහන - විශ්‍රාම වැටුප් සහිත බව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වෙනස් වේ.

2.2 බඳවා ගන්නා ශ්‍රේණිය - 111 ශ්‍රේණිය

2.3 වැටුප් පරිමාණය

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛනයට අනුව MN-1 2016 රු. 27,140-10X300-11X350-10X495-10X660-45,540 ක වැටුප් පරිමාණයක් හිමි වේ.

2.4 වයස් සීමාව

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

2.5 බඳවා ගැනීමේ සුදුසුකම්

2.5.1 අධ්‍යාපන සුදුසුකම්

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

හා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය අවම වශයෙන් එක් විෂයක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

2.5.2 වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්ද

1. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකම් සේ සැලකේ.
2. රජයේ හෝ රජයට අනුබද්ධ නේවාසිකාගාරයක/ආයතනයක සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී/සහකාර නිවාස පාලිකා හෝ ඊට සමාන හෝ උසස් තනතුරක වසර 02කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

2.0.3 කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.0.4 වෙනත් - 1. ශ්‍රී ලාංකික පුරවැසියකු වීම

2.විශිෂ්ට චරිතයක් ඇත්තකු වීම

### • පත්වීමේ ස්වාභාවය

බඳවා ගැනීම් සිදු කරනුයේ යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණයකින් ලද ප්‍රතිඵල මතය. එබැවින් ඔබ විසින් අත්‍යවශ්‍ය සියලු තොරතුරු සනාථ කරන ලිපි ලේඛන පිටපත් සහිතව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

පහත සඳහන් ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත සම්පූර්ණ කර 2024.01.22 දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, නො.100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ පිළිබඳ වැඩි විස්තර ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ www.moys.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

**අධ්‍යක්ෂ,**
**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.**